## ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාව - 2014

ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 18(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සභාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI-1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ආබාධිත තැනැත්තන් සඳහා වූ ජාතික සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සුපිරි වාසනා ලොතරැයියෙන් ලැබිය යුතු රු.2,760,530 ක ආදායම ගිණුම් ගත කර නොතිබුණි.

(ආ) ආධාරලාභීන් වෙත ගෙවීම සඳහා විවිධ ආධාර ලෙස මුදලින් යවන ලද එහෙත් ඔවුන් වෙත නොගෙවා සභාව වෙත ආපසු එවන ලද රු.558,558 ක් වෙනත් ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. එම ආධාර මුදල් අපසු ගෙවිය යුතුද යන්න නිශ්චිතව හඳුනා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවීම්**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 396 ප්‍රකාරව නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ මාස 6 ඉක්මවා තිබූ චෙක්පත් රජයේ ආදායමට බැර කළ යුතු වුවත් රු.247,392 ක් වටිනා චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 **මූල්‍ය ප්‍රතිඵලය**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු. 747,803 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 1,508,798 ක් වුයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.760,995 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. ජාත්‍යන්තර ආබාධිත දින වියදම රු.339,839 කින් වැඩිවීම, ප්‍රවේශ පහසුකම් (පොදු හා පෞද්ගලික ගොඩනැගිලි) වියදම රු.1,599,184 කින් වැඩිවීම හා අධ්‍යාපන ආධාර රු.740,741 කින් වැඩි විම මූල්‍ය ප්‍රතිඵල පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය**

සමාලෝචිත වර්ෂයේදී ආධාරක උපකරණ වෙනුවෙන් දරා ඇති වියදම රු.29,762,905 ක් වන අතර එය පසුගිය වසරේ වියදම වූ රු.21,600,284 ක මුදලට සාපේක්ෂව සියයට 37 ක ඉහළ යාමක් බව නිරීක්ෂණය විය. කෙසේ වුවද සංශෝධිත ක්‍රියාකාරී සැලැස්මට අනුව ආධාරක උපකරණ වියදම රු.26,000,000 ක් වූ බැවින් තථ්‍ය වියදම හා ක්‍රියාකාරී සැලැස්මට අනුව වියදම අතර රු.3,762,905 ක

වෙනසක් දක්නට ලැබුණි. ආධාරක උපකරණ සඳහා වැයකර ඇති මුදල සමාලෝචිත වර්ෂය සඳහා මුළු ප්‍රතිපාදනය වූ රු.46,800,000 ක මුදලින් සියයට 63 ක් බව වැඩිදුරටත් නිරීක්ෂණය කෙරේ.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

සමාලෝචිත වර්ෂයේ සභාවේ කාර්යසාධනයේ මූල්‍ය හා භෞතික ප්‍රගතිය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී නිවාස ආධාර සඳහා රු.මිලියන 75 ක් වැය කිරීමට අපේක්ෂා කළද රු.මිලියන 43.77 ක් පමණක් වැයකර තිබීම නිසා එහි මූල්‍ය කාර්යය සාධනය සියයට 58 ක් විය.

(ආ) ලිපිගොනු අනුව සමාලෝචිත වර්ෂයේදී ගොඩනැගිලි 34 ක් සඳහා ප්‍රවේශ පහසුකම් සපයා තිබියදී 2014 ප්‍රගති වාර්තාවෙහි ගොඩනැගිලි 18 කට පමණක් පහසුකම් සපයා තිබුණු බව දක්වා තිබුණි. ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තාව අනුව භෞතික ප්‍රගතිය සියයට 47 ක්ද මූල්‍ය ප්‍රගතිය සියයට 82 ක් ද විය.

**(ඇ) <u>ක්‍රීඩා ආධාර හා ආබාධිතයින් පුනරුත්ථාපනය කිරීම සඳහා වූ සංවිධාන සඳහා ආධාර</u>**

1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ 20 වන වගන්තිය අනුව 2014 දෙසැම්බර් 31 දින වන විට ස්වේච්ඡා සංවිධාන 117 ක් ආබාධිත සභාව යටතේ ලියාපදිංචි කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණ කරනු ලැබේ.

(i) පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව ආබාධ සහිත තැනැත්තන්ගේ තත්ත්වය නංවාලීම සඳහා රජය හා ස්වේච්ඡා සංවිධාන හා පුද්ගල මණ්ඩල විසින් සකස් කරන ලද, මූලාරම්භ කරන ලද හා ක්‍රියාත්මක කරනු ලබන වැඩ පිළිවෙලවල් හා යෝජනා ක්‍රම අධීක්ෂණය කිරීම හා සම්බන්ධීකරණය කිරීම සහ අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම සිදු කළ යුතු වූවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ii) ක්‍රීඩා ආධාර හා ආබාධිතයින් පුනරුත්ථාපනය කිරීම සඳහා සංවිධාන 12 කට මූල්‍ය ආධාර ලබාදීම සඳහා රු.250,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද සමාලෝචිත වර්ෂයේදී ආයතන 03ක් වෙනුවෙන් රු.162,080 ක් ආධාර ලබාදී තිබුණි. ඒ අනුව එහි මූල්‍ය කාර්යසාධනය සියයට 64 ක් හා භෞතික කාර්යය සාධනය සියයට 25 ක් විය.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව නිවාස ආධාර උපචිත වියදම් රු.7,300,000 ක් වුවද එදිනට ගෙවීම සඳහා අනුමත කල එහෙත් ගෙවීම් සිදුකර නොමැති වවුචර්වල වටිනාකම රු.74,280,756 ක් වූයෙන් නිවාස ආධාර හා උපචිත වියදම් රු.66,980,756 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) රජයේ වාර්ෂික ඇස්තමේන්තුව අනුව මූලධන වැය විෂය 124-2-5-2502 යටතේ ලබා දෙන ලද රු.46,860,000 ක ප්‍රතිපාදන මුදල භාවිතා කර ආයෝජන ලෙස අඩු ආදායම්ලාභී ආබාධ සහිත පුද්ගලයන්ට ආධාර ලබාදියයුතු වුවත් මෙම මුදලින් රු.1,039,537 සමාජ සේවා අමාත්‍යාංශයේ ඉන්ධන වියදම් ඇතුළු වෙනත් වියදම් පියවා ගැනීම සඳහා භාවිතා කර තිබුණි.

**(ඊ) අරමුණු ඉටු කර නොගැනීම**

1996 අංක 28 දරන ආබාධ සහිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ සඳහන් පහත කාර්යයන් ඉටු කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(i) ආබාධ සහිත තැනැත්තන් සම්බන්ධයෙන් සහ එවැනි තැනැත්තන්ට ලබා ගත හැකි සේවා සම්බන්ධයෙන් නිවැරදි සංඛ්‍යා ලේඛන පවත්වාගෙන යාම.

(ii) ආබාධවලට ප්‍රධාන හේතු දැන ගැනීම සහ ඒවා වැළැක්වීමේ හා පාලනය කිරීමේ ඵලදායි පියවර ප්‍රවර්ධනය කිරීම.

(iii) ආබාධ සහිත තැනැත්තන් සඳහා පුනරුත්ථාපන මධ්‍යස්ථාන පිහිටුවා පවත්වාගෙන යාම.

(iv) ආබාධ සහිත තැනැත්තන්ට නැවතීමේ පහසුකම් සලසා ඔවුන් රැක බලා ගැනීම සඳහා ආයතන පිහිටුවා පවත්වාගෙන යාම සහ එවැනි තැනැත්තන්ට අධ්‍යාපනික හා වෘත්තිය පුහුණුව ලබාදීම.

**4.2 දෘශ්‍ය අක්‍රමිකතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ ඇස් කණ්නාඩි ලබාදීම සඳහා රු.17,233,350 ක වියදම් දරා තිබූ අතර ඒවා ලබා දුන් බවට ඉදිරිපත් කර ඇති නාමලේඛන වල සඳහන් පුද්ගලයන්ගේ නම් සහ අත්සන් සාවද්‍ය ලෙස යොදා ඇති බව නිරීක්ෂණය විය. තවද රු.1,502,800 ක් වටිනා කණ්නාඩි විෂය භාර ආමාත්‍යවරයාගේ සම්බන්ධීකරන ලේකම් වෙත ලබාදී තිබුණි.

(ආ) තෝරාගනු ලැබූ අඩු ආදායම්ලාභී ආබාධිතයන් සඳහා රෝද පුටු ලබා දීම කළයුතු වුවද රු.1,618,500 වටිනා රෝද පුටු 130 ක් බාහිර පුද්ගලයන්ට ලබාදී තිබුණි.

**4.3 කාර්ය මණ්ඩලය**

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කාර්ය මණ්ඩලය 27 දෙනෙකු වූ අතර ස්ථිර කාර්ය මණ්ඩලය 09 ක් වූයෙන් තනතුරු 19 ක් පුරප්පාඩුව පැවතුණි. එම හේතුව නිසා සමාජ සේවා අමාත්‍යාංශයේ නිලධාරින් 06 දෙනෙකු හා අධිසේවක පදනම මත නිලධාරින් දෙදෙනෙකු සහ සමාජ සේවා දෙපාර්තමේන්තුවේ නිලධාරින් 03 දෙනෙකු ඇතුළත්ව නිලධාරීන් 20 දෙනෙකු සභාවේ කටයුතු සඳහා යොදවා ගෙන තිබුණි.

**05. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

**5.1 අයවැය පාලනය**

අයවැය ලේඛනයේ ඇස්තමේන්තු ගත ආදායම් හා වියදම්, සත්‍ය ආදායම් හා වියදම් සමග සැසඳීමේදි සියයට 16 සිට සියයට 100 ක පරාසයක් තුළ විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අය වැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5.2 නොවිසඳී ඇති විගණන ඡේද**

2012 ඔක්තෝබර් 12 වන දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා රැස්වීමේදී ගනු ලැබූ නියෝග ක්‍රියාත්මක කර නොතිබූ අවස්ථාවන් පහත දැක්වේ.

| කාරක සභා නියෝග අංකය | නියෝගය |
|---|---|
| 05 | ආබාධිත පුද්ගලයන්ගේ මහ ලේකම් කාර්යාලය විසින් නීතිපති වෙත ඉදිරිපත් කරන ලද ආබාධිතයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ පනත් කෙටුම්පත එක්සත් ජාතින්ගේ ප්‍රඥප්තිය ප්‍රකාරව පිළියෙල කර ඇද්ද යන්න අමාත්‍යවරයා සමඟ සාකච්ඡා කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීම. |
| 06 | රට තුල ජීවත් වන ආබාධිත පුද්ගලයන්ගේ මෑත කාලීන තොරතුරු පිළිබඳ දත්ත බැංකුවක් පවත්වා ගෙන යාමට අදාල ක්‍රියාදාමය පිළිබඳ වාර්තාවක් 2014 දෙසැම්බර් 31 දිනට ලබා දීම. |
| 07 | දිවයින පුරා පුනරුත්ථාපන මධ්‍යස්ථාන වලට ආධාර කිරීමට කැමති සමිති / පුද්ගලයන් සමග සම්බන්ධීකරණයක් පවත්වා ගැනීමට සහ එවැනි මධ්‍යස්ථාන වල ප්‍රමිතිය ඉහල නැංවීම සඳහා අරමුදල් ලබා ගැනීමට සහ පහත සඳහන් තොරතුරු පිළිබඳ විස්තරාත්මක වාර්තාවක් සතියක් තුළ ඉදිරිපත් කිරීම.<br><br>(අ) එක් එක් දිස්ත්‍රික්කයෙහි පවතින පුනරුත්ථාපන මධ්‍යස්ථාන සංඛ්‍යාව.<br><br>(ආ) මෙම මධ්‍යස්ථාන පවත්වා ගෙන යනුයේ කවුරුන් ද යන්න .<br><br>(ඇ) එක් එක් මධ්‍යස්ථානයේ සිටින ආබාධිත පුද්ගලයන් සංඛ්‍යාව |
| 08 | ආබාධිතයන් සඳහා වූ පාසල් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි කිරීමට ඇති හැකියාව සොයා බැලීම පිළිබඳ වූ පහත කරුණු සම්බන්ධයෙන් අවධානය යොමු විය.<br><br>(අ) ආබාධිත පුද්ගලයන්ට විශේෂ අධ්‍යාපන පහසුකම් ලබා දීම සඳහා දිවයින වටා පාසල් 25 ක් ඇති බව.<br><br>(ආ) මෙම පාසල් තුළ සංවර්ධනය කළ යුතු පහසුකම් පිළිබඳව.<br><br>(ඇ) ගුරුවරුන් පුහුණු කරනුයේ කෙසේද යන වග .<br><br>(ඈ) මොවුනට ස්ථිර පත් වීම් ලබාදීමේ හැකියාව පිළිබඳව.<br><br>(ඉ) අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ මෙම පාසල් ලියාපදිංචි කිරීමේ වැදගත්කම. |
| 09 | නිවාස ආධාර, ස්වයං රැකියා ආධාර, වෛද්‍ය සහ අධ්‍යාපන ආධාර වශයෙන් එකතුව රු. මිලියන 22 ක් වැය කර ඇති බව කමිටුවේ නිරීක්ෂණයට භාජනය වූ අතර මෙම වියදම් සනාථ කිරීම සඳහා වූ ප්‍රගති වාර්තා විගණනය වෙත ලබා දී නොතිබුණි.ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් දීමනා ලබා දීමටත් මේ |

සම්බන්ධයෙන් වන ප්‍රගති වාර්තා ඉදිරිපත් කරන ලෙසට සියළුම ප්‍රාදේශීය ලේකම් අමතා චක්‍රලේඛයක් නිකුත් කරන ලෙසටත් කමිටුව විසින් උපදෙස් දෙන ලදි.

10 වවුචරයේ නම සඳහන් නොවන හා නීත්‍යානුකූල නියෝජිතයෙකු නොවන පුද්ගලයෙකුට මුදල් පොතේ කිසිදු සඳහන් කිරීමකින් තොරව රු.651,900 ක මුදලක් ගෙවා ඇති බව කමිටුව නිරීක්ෂණය කළ අතර ප්‍රධාන ගණන් දීමේ නිලධාරි විසින් ඉදිරිපත් කළ පිළිතුර සම්බන්ධයෙන් කමිටුව සෑහිමකට පත් නොවූ බැවින් ඒ සම්බන්ධ සවිස්තර වාර්තාවක් කමිටුවට සහ විගණනය වෙත එවන ලෙස උපදෙස් දෙන ලදි.

11 2010, 2011 සහ 2012 වර්ෂ වලදී , වෙන් කළ මුල්‍ය ප්‍රතිපාදන වලින් වැඩි ප්‍රමාණයක් ඇස් කණ්නාඩි සැපයීම සඳහා වැය කර ඇති අතර 2012 වර්ෂයේ දී කණ්නාඩි 95,392 ක් සඳහා රු. මිලියන 13 ක් වියදම් කර තිබුණ ද මේවා ප්‍රතිලාභීන්ට නියමිත අයුරින් ලැබුණේද යන්න සනාථ කිරීම සඳහා ප්‍රගති වාර්තා ඉදිරිපත් කර නොමැති බවට කමිටුවේ අවධානයට යොමුවිය මෙම මුළු ක්‍රියාවලිය පිළිබඳව ප්‍රගති වාර්තාවක් කමිටුවට සහ විගණනය වෙත ලබා දෙන ලෙස නියෝග කර ඇත.

## 06. පද්ධති හා පාලනයන්

පහත සඳහන් පද්ධති හා පාලන දූර්වලතා සම්බන්ධයෙන් වරින්වර සභාවේ සභාපතිවරයාගේ අවධානයට යොමුකර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

(අ) ගිණුම්කරණය
(ආ) නිවාස ආධාර ගෙවීම